www.agaram.lk

# නාලන්දා විද්‍යාලය - කොළඹ 10

## ඒකක පරීක්ෂණය

| 11 ශ්‍රේණිය | බුද්ධ ධර්මය | 1 ඒකකය |
|---|---|---|

**බුදු සිරිත අනුව යමු අභියෝග ජයගනිමු.**

**I කොටස**

**01. නිවැරදි පිළිතුර ලකුණු කරන්න.**

1. මාර දූවරුන්ගෙන් කෙනෙක් නොවන්නේ,
   - i. තණ්හා
   - ii. අරති
   - iii. රගා
   - iv. නදා

2. "සමග්ගා හෝථ මා විවදථ" යන්නෙහි අදහස වනුයේ,
   - i. විවාද නිතර නිතර කරන්න.
   - ii. විවාද වාද නොකර සිටින්න.
   - iii. සමගිව වාද විවාද කරන්න.
   - iv. සමගිවන්න විවාද නොකරන්න.

3. සිව්පසය පිළිවෙලින් ඇති වර්ණය වන්නේ,
   - i. චීවර, පිණ්ඩපාත, ගිලානප්‍රත්‍යය, සේනාසන
   - ii. චීවර, පිණ්ඩපාත, සේනාසන, ගිලානප්‍රත්‍යය
   - iii. චීවර, සේනාසන, පිණ්ඩපාත, ගිලානප්‍රත්‍යය
   - iv. චීවර, ගිලානප්‍රත්‍යය, පිණ්ඩපාත, සේනාසන

4. බුදුරජාණන් වහන්සේ ධරමාන සමයේදීම ධර්මධර විනයධර භික්ෂූන් අතර ගැටුමක් ඇතිවිය. එම විහාරය වන්නේ,
   - i. රජගහනුවර ජේතවනාරාමයයි
   - ii. කිඹුල්වත්නුවර නිග්‍රෝධාරාමයයි
   - iii. බරණැස ඉසිපතනාරාමයයි
   - iv. කොසඹෑනුවර ඝෝෂිකාරාමයයි

5. ගෞතම බුදු සසුනේ අගසව් තනතුරු ලැබුවේ,
   - i. උපතිස්ස කෝලිත
   - ii. සැරියුත් හිමි, ලෝකස හිමි
   - iii. සැරියුත් හිමි, මුගලන් හිමි
   - iv. මුගලන් හිමි, කෝලිත හිමි

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!



agaram.lk

## II කොටස

- **සියළුම ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.**

02. 1. දස මාර සේනාව නම් කරන්න.
    2. ''සමවායෝ එව සාධු'' යන්නෙහි අර්ථය ලියන්න.
    3. අභියෝගයන් යනු කුමක්දැයි සඳහන් කරන්න.
    4. සිදුහත් බෝසතාණන් වහන්සේ මුහුණ දුන් අභියෝගයන් සඳහන් කරන්න.
    5. බුදුරජාණන් වහන්සේ මුහුණ දුන් අභියෝගයන් සඳහන් කරන්න.
    6. අකීකරු ඝෝෂිකාරාම භික්ෂූන්ගෙන් ඉවත්ව බුදුරදුන් වැඩම කළ ස්ථානය සඳහන් කරන්න.
    7. පස්වග තවුසන් පිළිවෙලින් සඳහන් කරන්න.
    8. පාසල් සිසුවෙක් ලෙස ඔබට පන්තියේ ඇති අභියෝග හතරක් සඳහන් කරන්න.
    9. බුදුරදුන් වේරංජාවේ වස් වැඩ සිටි අවස්ථාවේ මුහුණදුන් අභියෝගය කුමක්ද?
    10. ඔබට අභියෝගවලට මුහුණ දීමෙන් ලැබෙන ප්‍රයෝජන දෙකක් සඳහන් කරන්න.

03. 1. අභියෝගයක් යනු කුමක්දැයි සඳහන් කරන්න.
    2. බුදුරදුන්ගේ ප්‍රථම උදාන පාඨය හා එහි අර්ථය ලියන්න.
    3. අභියෝගවලට මුහුණ දීමෙන් සාර්ථක ජීවිතයක් ගොඩනගාගත හැකිය. බුද්ධ චරිතය ඇසුරින් පැහැදිලි කරන්න.

04. 1. බුදු සිරිතේ අභියෝගාත්මක සිදුවීම් හතරක් කරුණු ලෙස සඳහන් කරන්න.
    2. ඔබ ජීවිතයේ මුහුණදී ඇති අභියෝගයන් හතරක් සඳහන් කරන්න.
    3. එම අභියෝගයන් විසඳා ගැනීමට ක්‍රියා කළේ කෙසේදැයි පැහැදිලි කරන්න.

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!


agaram.lk